සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ............................................
දිනය / திகதி / Date: 2022.03.07

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2020/11 ට දෙවන එකතුව**

**සියළුම පාලක මණ්ඩල සභාපතිවරුන්/ විධායක කමිටු සභාපතිවරුන්,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කළමණාකරුවන් වෙත.**

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති ගොඩනැගිලි ඉදිකිරීම් ණය මුදල් - ණය සීමාව වැඩි කිරීම.</u>**

01. 2020.09.02 දිනැති සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2020/11 මගින් සමෘද්ධි බැංකු සහ බැංකු සමිති ගොඩනැගිලි ඉදිකිරීමට අවශ්‍ය අරමුදල් සම්පාදනය සඳහා ණය පහසුකම් ලබාගැනීම, ආපසු ගෙවීම හා ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සඳහා වූ ක්‍රියා පිළිවෙත් පිළිබඳ උපදෙස් ලබා දී ඇත.

02. 2021.07.22 දිනැති සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2020/11 ට පළමු එකතුව මගින් ගොඩනැගිල්ල සඳහා ණය ලබාගත හැකි මූලාශ්‍රයන් පුළුල් කර ඇත. ඒ අනුව සමෘද්ධි බැංකු සමිතියක් මගින් ණය මුදල් ලබාගැනීමට අමතරව අරමුදල් ඇති සමෘද්ධි බැංකුවක් මගින් ද ණය ලබාගැනීමට අනුමැතිය ලබා දී ඇත.

03. මුල් චක්‍රලේඛයේ ඡේද අංක 4.1 උපඡේදය මගින් ලබාගත හැකි / ලබා දිය හැකි ණය මුදලෙහි උපරිමය දක්වා ඇත. එම සීමාව 2021.11.12 දින පැවති කළමනාකරණ මණ්ඩල තීරණ අංක 2021/92/06 මගින් ණය ලබාදිය හැකි/ ලබාගත හැකි උපරිම සීමාව රු.මිලියන 10 දක්වා වැඩි කර ඇත. මෙහි උපරිම ණය මුදල ලබාගැනීමේ දී ගොඩනැගිල්ල අවම වශයෙන් වර්ග අඩි 1000 හෝ ඊට වැඩි වපසරියක් තිබිය යුතුය.

04. අදාල ණය මුදල ලබාගැනීමට එක් බැංකුවක මුදල් ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී බැංකු කිහිපයක අරමුදල් ලබාගෙන ණය මුදල ලබාදිය හැකිය.

05. මෙහි සඳහන් නොවෙන අනෙකුත් උපදෙස් සඳහා 2020/11 මුල් චක්‍රලේඛනය හා 2020/11 ට පළමු එකතුවෙහි සඳහන් උපදෙස් තවදුරටත් වලංගු කර ගන්නා මෙන් දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.- කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
6. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |